# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2140/21 - 2019 සැප්තැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2019.09.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2013 අංක 1 දරන සමෘද්ධි පනත

2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 42 වන වගන්තිය යටතේ ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

දයා ගමගේ,
ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

1. මෙම නියෝග 2019 අංක 1 දරන සමෘද්ධි නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 25(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා පනතේ 29(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති පරිගණක ගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිගණක සහකාරවරුන් බඳවා ගැනීමත් එකී නිලධාරීන් සඳහා එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ අරමුදලින් සුදුසු පාරිශ්‍රමිකයක් ගෙවීමත් සමෘද්ධි පනතේ 33(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ සිදුකිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුතු ය.

09 - 834

1A - G 30963 — 20 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*